සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2017 ජූලි

## (AA31) මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Financial Accounting and Reporting)

2017-07-15
පෙරවරු
[8.45 – 12.00]

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 09

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පමය ආකෘති රාමුව මඟින් මූල්‍ය ප්‍රකාශනවල අරමුණු, මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය නිශ්චය කරන ගුණාත්මක ලක්ෂණ, මූල්‍ය ප්‍රකාශන ගොඩනැඟීමට යොදාගන්නා මූලිකාංග නිර්වචනය, හඳුනාගැනීම හා මැනීම සහ ප්‍රාග්ධනය හා ප්‍රාග්ධනය නඩත්තු කිරීම පිළිබඳ වූ සංකල්ප පිළිබඳව ක්‍රියා කෙරේ.

(a) තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය වැඩිකරන ගුණාත්මක ලක්ෂණ දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) ආදායම හඳුනාගැනීම සඳහා වූ නිර්ණායකය (recognition criteria for income) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකාවේ සමාගම්වලට අදාලවන ව්‍යවස්ථා / පනත් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවාලීමේ අරමුණු දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 23 (LKAS 23) - ණය ගැනුම් පිරිවැය (borrowing cost) අනුව "සුදුසුකම් ලබන වත්කමක්" (Qualifying Asset) යන පදය **නිර්වචනය කරන්න**. (ලකුණු 02)

(b) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 18 (LKAS 18) - අයභාරය අනුව භාණ්ඩ විකිණීමෙන් ලැබෙන අයභාරය හඳුනාගැනීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රවාහ, මෙහෙයුම් ක්‍රියාකාරකම්, ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් වර්ගීකරණය කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තා කළ යුතුයි.

(a) ආයෝජන ක්‍රියාකාරකම් තුලින් පැන නගින මුදල් ප්‍රවාහ සඳහා උදාහරණ තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් බැහැර කරනු ලබන මුදල් නොවන ගනුදෙනු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත ABC සමාගමේ,** 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 මැයි 15 දින අනුමත කරන ලදී.

පහත සඳහන් තොරතුරු **සීමාසහිත ABC සමාගමට** අදාල වේ:

(1) සමාගම, 2017 මාර්තු 31 දිනට වූ එක්තරා තොගයක්, පිරිවැයට, රු.750,000/- ක් ලෙස හඳුනාගන්නා ලදී. මෙම තොගය, 2017 අප්‍රේල් 20 වන දින රු.700,000/- කට විකුණන ලදී.

(2) 2017 අප්‍රේල් 30 දින, සමාගමේ ප්‍රධාන නිෂ්පාදන පිරියතයක් ගින්නෙන් විනාශ විය. හානිය රු. මිලියන 5.5 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 10 (LKAS 10) - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් අනුව ඉහත සිදුවීම් ගිණුම්ගත කරන්නේ කෙසේදැයි, හේතු සහිතව **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) **සීමාසහිත KYC සමාගම** (කල්බදු විකුණුම්කරු) වර්ෂ 5 ක කල්බදු කාලයක් සඳහා වූ මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ 2016 අප්‍රේල් 01 දින ගනුදෙනුකරුවෙකුට (කල්බදු ගැනුම්කරු) යන්ත්‍රයක් විකුණයි. යන්ත්‍රයේ මුදලට විකුණුම් මිල රු. මිලියන 3 ක් වූ අතර, යන්ත්‍රයේ පිරිවැය රු. මිලියන 2.4 ක් විය.

කල්බදු පහසුකමට අදාල පොලී අනුපාතිකය වර්ෂයකට 18% බැගින් වූ අතර, වාර්ෂික කල්බදු වාරිකය රු.959,325/- ක් විය. කල්බදු ගැනුම්කරු විසින් 2017 මාර්තු 31 දින ප්‍රථම කල්බදු වාරිකය ගෙවන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් කල්බදු ගනුදෙනු වලට අදාලව, කල්බදු විකුණුම්කරුගේ 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සහ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උධෘතයන් (extracts) **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත ඩිවයින් හෝල්ඩින්ග්ස් සමාගමේ** 2017 මාර්තු 31 දිනට සහ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන් පහත සඳහන් පරිදි වේ:

**සීමාසහිත ඩිවයින් හෝල්ඩින්ග්ස් සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | 2017 මාර්තු 31 දිනට | 2016 මාර්තු 31 දිනට |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට) | 11,000 | 10,100 |
| සමුච්චිත ක්ෂය | (2,400) | (1,950) |
| ධාරණ අගය | **8,600** | **8,150** |
| | | |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 9,070 | 8,400 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 8,200 | 6,900 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 470 | 600 |
| | **17,740** | **15,900** |
| **මුළු වත්කම්** | **26,340** | **24,050** |
| **ස්කන්ධය සහ වගකීම්** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 6,000 | 6,000 |
| රඳවාගත් ඉපැයීම් | 16,610 | 13,910 |
| **මුළු ස්කන්ධය** | **22,610** | **19,910** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය) | 1,300 | 1,200 |
| දිගු කාලීන ණය | - | 1,100 |
| | **1,300** | **2,300** |
| **ජංගම වගකීම්:** | | |
| කෙටිකාලීන ණය | 200 | 300 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,370 | 800 |
| ණය සඳහා ගෙවිය යුතු පොලී | 260 | 240 |
| ගෙවිය යුතු ආදායම් බදු | 600 | 500 |
| | **2,430** | **1,840** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **26,340** | **24,050** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.300,000/- කි.

(2) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු පොලී වියදම රු.250,000/- කි.

(3) වර්ෂය තුළ පාරිතෝෂික වශයෙන් රු.250,000/- ක් ගෙවා තිබුණි.

(4) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් කිසිවක් නොවූ අතර, වර්ෂය තුළ ලාභාංශ ගෙවීමක් හෝ ප්‍රකාශයට පත්කිරීමක් කර නොතිබුණි.

(5) වර්ෂය තුළදී දේපළ, පිරියත සහ උපකරණවල කිසිදු ඉවත් කිරීමක් සිදුකර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ඩිවයින් හෝල්ඩින්ග්ස් සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය <u>වක්‍ර ක්‍රමය</u> (indirect method) භාවිත කර **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

ඔබ, **සීමාසහිත PG හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගමේ** අළුතෙන් බඳවාගනු ලැබූ ගණකාධිකාරිවරයා වේ. පහත සඳහන් කරුණු පිළිබඳව පසුගිය වර්ෂය සමග සන්සන්දනය කරමින් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා ඔබෙන් විමසා ඇත:

- සමාගමේ ද්‍රවශීලතාවය.
- සමාගමේ ලාභදායකත්වය.
- කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ කාර්යක්ෂමතාවය.

වාර්තාව පිළියෙල කිරීමේදී ඇතුලත් කිරීම සඳහා 2017 මාර්තු 31 සහ 2016 මාර්තු 31 දිනයන්ගෙන් අවසන් වර්ෂ සඳහා පහත සඳහන් අනුපාත ඔබ විසින් ගණනය කර තිබේ:

| අනුපාතය | 2017 | 2016 |
|---|---|---|
| ජංගම අනුපාතය | වාර 1.2 | වාර 2 |
| ක්ෂණික වත්කම් අනුපාතය | වාර 0.25 | වාර 1.2 |
| දළ ලාභ අනුපාතය | 23% | 35% |
| ශුද්ධ ලාභ අනුපාතය | 15% | 20% |
| ණය එකතුකිරීමේ කාල සීමාව | දින 45 | දින 30 |
| ණයහිමියන්ගේ පියවීමේ කාලසීමාව | දින 20 | දින 15 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගණනය කර ඇති අනුපාත භාවිත කරමින්, සමාගමේ ද්‍රවශීලතාවය, ලාභදායකත්වය සහ කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ කාර්යක්ෂමතාවය පිළිබඳව අදහස් දක්වමින් සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් **පිළියෙල කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත රෝයල් පොදු සමාගමේ** 2017 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහතින් දක්වා ඇත:

**සීමාසහිත රෝයල් පොදු සමාගම**

**2017 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් 2,000,000 | | 20,000 |
| 2016 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 3,880 |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ වටිනාකම - රු.7,500,000/-) | 12,500 | |
| මෝටර් වාහන | 18,000 | |
| කාර්යාල උපකරණ | 6,000 | |
| ලීබඩු සහ සවිකිරීම් | 2,400 | |
| 2016 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 1,920 |
| මෝටර් වාහන | | 3,600 |
| කාර්යාල උපකරණ | | 1,200 |
| ලීබඩු සහ සවිකිරීම් | | 1,440 |
| 2017 මාර්තු 31 දිනට, තොග (පිරිවැයට) | 1,500 | |
| 12.5% බැංකු ණය | | 5,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 11,700 | 8,210 |
| 2016 අප්‍රේල් 01 දිනට, වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 600 |
| 2015/16 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බදු | | 1,400 |
| බැංකුවේ ඇති මුදල් | 400 | |
| අතැති මුදල් | 140 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 52,000 | 78,200 |
| වෙනත් ආදායම් | | 800 |
| ගෙවූ අතුරු ලාභාංශ | 1,600 | |
| පරිපාලන වියදම් | 6,800 | |
| බෙදාහැරීමේ වියදම් | 8,750 | |
| මූල්‍ය වියදම් | 2,460 | |
| ගෙවූ ආදායම් බදු | 2,000 | |
| | **126,250** | **126,250** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2016 සැප්තැම්බර් 30 දින, සමාගම ලොරි රථයක් රු.800,000/- කට විකුණා ඇත. මෙම ලොරිය 2013 අප්‍රේල් 01 දින රු.1,400,000/- ක පිරිවැයකට මිලදීගෙන තිබුණි. විකිණීමෙන් ලද රු.800,000/- ක මුදල වෙනත් ආදායම් ගිණුමට බැර කර තිබුණි. ඒ හැර මෙම ලොරිය ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහන් තැබීමක් කර නොතිබුණි.

(2) සමාගම වර්ෂය තුළ පහත සඳහන් වත්කම් මිලදීගෙන ඇත:

| දිනය | වත්කම | වටිනාකම (රු.) |
|---|---|---|
| 2016.12.01 | පොත් රාක්ක | 600,000 |
| 2017.03.01 | අධි බලැති මුද්‍රණ යන්ත්‍ර | 900,000 |

(3) සරල මාර්ග පදනම යටතේ පිරිවැය මත ක්ෂය, ගණනය කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ වල ප්‍රයෝජනවත් ආයුකාල පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂ 25 |
| මෝටර් වාහන | : | වර්ෂ 5 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 5 |
| ලිබඩු සහ සවිකිරීම් | : | වර්ෂ 10 |

(4) පසුගිය වර්ෂයේ බොල්ණයක් ලෙස ලියාහරින ලද රු.100,000/- ක මුදලක් ණයගැතියෙකුගෙන් වර්ෂය තුළදී සමාගම විසින් අයකරගෙන තිබූ අතර, එම ප්‍රමාණය වෙළෙඳ ලැබිය යුතු මුදල් ගිණුමට බැර කරන ලදී. තවද, වර්ෂය අවසානයේදී රු.280,000/- ක අතිරේක අඩමාන ණය ප්‍රතිපාදනයක් සිදුකළ යුතුව ඇත.

(5) 2017 මාර්තු 31 දිනට, ගිණුම් පොත්වල පහත සඳහන් වියදම් උපචිත කර නොතිබුණි:

| | රු. |
|---|---|
| ඉන්ධන ගාස්තු | 685,000 |
| විදුලිය සහ ජලය | 68,000 |

(6) 2017 මාර්තු මාසය සඳහා වූ රු.100,000/- ක ණය වාරිකය 2017 මාර්තු 31 දිනට, හිඟව තිබුණි. ණය වාරිකයෙහි ඇතුළත් පොලී කොටස රු.60,000/- ක් විය. 2017 මාර්තු 31 දිනට හිඟව ඇති ණය ශේෂයෙන් $\frac{1}{4}$ ක් ඊළඟ වර්ෂයේදී ආපසු ගෙවිය යුතු විය.

(7) 2017 මාර්තු 30 දින, සමාගමේ සැපයුම්කරුවෙකු විසින් ඔහු සමග තිබූ ගිවිසුමක කොන්දේසි කඩකරන ලදැයි සමාගමට එරෙහිව නඩුවක් පවරා ඇත. අධිකරණය විසින් 2017 මැයි 31 දින සැපයුම්කරුට රු.150,000/- ක වන්දියක් ගෙවන ලෙස නියෝග කර තිබුණි.

(8) 2016/17 තක්සේරු වර්ෂය සඳහා සමාගමෙහි ආදායම් බදු වගකීම රු.900,000/- ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇත.

(9) අවසාන තොගය ශුද්ධ උපලබ්ධි අගයට රු.1,450,000/- කට ඇගයීම් කර තිබුණි.

(10) 2017 මැයි 20 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, 2017 මාර්තු 31 දිනට පැවති සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු.1.50 බැගින් වූ අවසාන ලාභාංශයක් ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

(11) අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2017 ජූනි 05 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන් **සීමාසහිත රෝයල් පොදු සමාගමේ** පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 06)

(c) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණ වල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(a) 2017 මාර්තු 31 දිනට **සීමාසහිත මෙගා සප්ලයිස් (පෞද්ගලික) සමාගම (MSL)** සහ **සීමාසහිත ස්මාට් ටෙක්නොලොජ් (පෞද්ගලික) සමාගම (STL)** යන සමාගම් දෙකේ පොත්වලින් පහත දැක්වෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශන උපුටාගන්නා ලදි:

**2017 මාර්තු 31 දිනට**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | **සීමාසහිත මෙගා සප්ලයිස් (පෞද්ගලික) සමාගම (MSL)** | **සීමාසහිත ස්මාට් ටෙක්නොලොජ් (පෞද්ගලික) සමාගම (STL)** |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 50,000 | 21,500 |
| සමුච්චිත ක්ෂය | (15,000) | (7,500) |
| ධාරණ අගය | 35,000 | 14,000 |
| STL හි ආයෝජනය | 20,000 | - |
| | **55,000** | **14,000** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 12,100 | 10,900 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 36,400 | 9,600 |
| | **48,500** | **20,500** |
| **මුළු වත්කම්** | **103,500** | **34,500** |
| **ස්කන්ධය සහ වගකීම්** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 40,000 | 15,000 |
| රඳවාගත් ඉපැයීම් | 22,500 | 14,600 |
| **මුළු ස්කන්ධය** | **62,500** | **29,600** |
| | | |
| **ජංගම නොවන වගකීම්:** | | |
| බැංකු ණය | 20,400 | - |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 5,500 | 2,500 |
| බැංකු අයිරා | 15,100 | 2,400 |
| | **20,600** | **4,900** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **103,500** | **34,500** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2016 අප්‍රේල් 01 දින, **MSL** විසින් **STL** හි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් අත්පත් කර ගන්නා ලදී.

(2) අත්පත් කරගත් දිනට **STL** හි දේපළ, පිරියත සහ උපකරණවල සාධාරණ අගය රු. මිලියන 19 ක් විය.

(3) අත්පත් කරගත් දිනට, පාලනය නොවන හිමිකමේ (non-controlling interest) සාධාරණ අගය රු. මිලියන 9 ක් වූ අතර, **STL** හි පොත්වල පෙන්වූ රඳවාගත් ඉපැයීම් රු. මිලියන 10 ක් විය.

(4) සමාගම් දෙකම දේපළ, පිරියත සහ උපකරණ සරල මාර්ග පදනම යටතේ වර්ෂයකට 20% බැගින් වූ අනුපාතිකයකට ක්ෂය කරනු ලබයි.

(5) 2017 මාර්තු මාසය තුළදී **MSL** විසින් රු.500,000/- ක් වටිනා තොග, පිරිවැය මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව **STL** වෙත විකුණූ අතර, ඒවායින් 25% ක තොගයක් 2017 මාර්තු 31 දිනට නොවිකිණී තිබුණේය.

(6) **MSL** හි වෙළෙඳ ලැබිය යුතු මුදල් වල වර්ෂය තුළ කරන ලද ගනුදෙනු වෙනුවෙන් **STL** වෙතින් ලැබිය යුතු රු.200,000/- ක් ඇතුළත්ය.

ඉහත තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒකාබද්ධ කිරීමේදී ඇතිවන කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) 2017 මාර්තු 31 දිනට පාලනය නොවන හිමිකම (non-controlling interest) **ගණනය කරන්න**. (ලකුණු 03)

(c) 2017 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 11)

(b) **සීමාසහිත ABC සමාගමේ** 2017 මාර්තු 31 දිනෙන් සහ 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා ගණනය කරන ලද වැදගත් මූල්‍ය අනුපාත තුනක් පහතින් දී ඇත:

| | **2017** | **2016** |
|---|---|---|
| (1) තෝලන අනුපාතය (Gearing Ratio) | 65% | 40% |
| (2) යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය (ROCE) | 9% | 6% |
| (3) තොග පිරිවැටුම් අනුපාතය (Stock turnover ratio) | වාර 15 | වාර 10 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පෙර වර්ෂය සමග සසඳා බැලීමේදී ඉහත දැක්වෙන එක් එක් අනුපාතය, 2017 දී වැඩිවීමට තුඩුදිය හැකි හේතු දෙකක්(02) බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |